සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
நலன்புரி நன்மைகள் சபை
WELFARE BENEFITS BOARD
මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
Ministry of Finance, Economic Stabilaization & National Policies
මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல / My No. | WBB/02/Notice/D/Div.S/2023 | ඔබේ අංකය / உமது இல / Your No | | දිනය / திகதி / Date | 2023. 02. 13 |

සියලුම ප්‍රාදේශීය ලේකම්වරු වෙත,

**<u>සුබසාධක ප්‍රතිලාභ ගෙවීම ලැබීම පිණිස සුදුසු තැනැත්තන් / පවුල් හඳුනා ගැනීම - 2022 ක්ෂේත්‍ර සමීක්ෂණය</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාල හරහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත නිකුත් කර ඇති "දත්ත ඇතුළත් කරන ක්ෂේත්‍ර නිළධාරීන්ගේ කාර්යභාරය පිළිබඳ මාර්ගෝපදේශ අත්වැල" හා බැඳේ.

02. එහි සඳහන් කරුණු සම්බන්ධයෙන් පහත පරිදි සංශෝධන සිදු විය යුතු බව කාරුණිකව දන්වා සිටිමි.

(01) පිටු අංක 14

පවුලේ සාමාජිකයින් පිළිබඳ දත්ත රැස් කිරීම - සාමාජික තොරතුරු යන ශීර්ෂය යටතේ

01 පියවර -

"සාමාජිකයා ගෘහ මූලිකයාට ඇති නෑදෑ සම්බන්ධතාවය" යන්න "සාමාජිකයා අයදුම්කරුට ඇති නෑදෑ සම්බන්ධතාවය" ලෙස සංශෝධනය වී ඇත.

ඒ අනුව මෙම තොරතුරට අයත් අයිතම පහත පරිදි සංශෝධනය වී ඇත.

- තමා (අයදුම්කරු)
- භාර්යාව
- ස්වාමිපුරුෂයා
- පුතා
- දුව
- බෑනා
- ලේලි
- මව
- පියා
- වෙනත් නෑදෑයෙක්
- වෙනත්

❖ අයදුම්කරුගේ තොරතුරු ඇතුළත් කරන විට අයිතමය තෝරා ගැනීමේදී "තමා (අයදුම්කරු)" යන පළමු අයිතමය තෝරා ගත යුතුය.

(02) ජංගම යෙදවුම් මෘදුකාංගය තුළ "දත්ත ලබා දෙන ලද්දේ අයදුම්කරු විසින්ද?" ඔව් / නැත ලෙස ප්‍රශ්නයක් අලුතින් ඇතුළත් කර ඇත. එහි දී අයදුම්කරු ප්‍රකාශය ලබා දෙන්නේ නම් "ඔව්" ලෙසද, අයදුම්කරු හැර පවුලේ සාමාජිකයකු හෝ වෙනත් අයෙකු ප්‍රකාශය ලබා දෙන්නේ නම් "නැත" ලෙසද තේරිය යුතුය.

එහිදී අයදුම්කරු හැර එම ප්‍රකාශය ලබා දෙන පුද්ගලයා කවරකු ද යන්න අයදුම්කරුට ඇති නෑදෑ සම්බන්ධතාවය අනුව අයිතම අතරින් තේරිය යුතුය.

(03) "දත්ත එක්රැස් කරන නිලධාරියා විසින් අත්සන් කරන ලද QR කේතය ඡායාරූපය" යන තොරතුරු තීරුව "ඉල්ලුම්කරු සහ දත්ත එක්රැස් කරන නිලධාරියා යන දෙදෙනාම අත්සන් කරන ලද QR කේතයේ ඡායාරූපය ලබා ගන්න" ලෙස සංශෝධනය කර ඇත.

උක්ත සංශෝධන කෙරෙහි ඔබගේ විශේෂිත අවධානය යොමු කර ක්ෂේත්‍ර සමීක්ෂණයේ නිරත වන නිලධාරීන් මේ සම්බන්ධයෙන් දැනුවත් කරන ලෙසත් ඒ අනුව අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි.

බී.විජයරත්න
සභාපති/කොමසාරිස්

පිටපත් -
සියළු දිසාපතිවරුන් වෙත - කාරු.දැගැ.ස.